0165

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන- 2020/2021
අවසාන පරීක්ෂණය - 6 වන මට්ටම
EPU6234 - ප්‍රාථමික පන්තිකාමර කළමනාකරණය
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.23 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ශ්‍රී ලංකා ප්‍රාථමික පාසල් වලට අදාලව **"කළමනාකරණය "** යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

02. කළමනාකරණ ක්‍රියාවලියේ මූලික අංග කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "ප්‍රාථමික පාසලක සිටින සියලු ගුරුවරුන්ට පන්තිකාමර කළමනාකරණය පිළිබඳ දැනුම ඉතා වැදගත් වේ. "

    ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? කරුණු **පහක් (05)** දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට අදාළ මූලික නිපුණතා **පහක් (05)** සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. සම්පත් කළමනාකරුවෙකු ලෙස ප්‍රාථමික **පාසල්** ගුරුවරයෙකුගේ භූමිකාව කෙටියෙන් විස්තර කරන්න.

06. "අධීක්ෂණය " යන සංකල්පය නිර්වචනය කරන්න.

07. නියෝජ්‍ය විදුහල්පති වරයෙකුගේ (අධ්‍යාපන සංවර්ධන) වගකීම් **පහක් (05)** ලැයිස්තු ගත කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

08. ප්‍රාථමික පාසලක මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීමේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## II වන කොටස

09. (i.) "අධ්‍යාපන ප්‍රතිසංස්කරණ" යන යෙදුම පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(ii.) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් පසු අධ්‍යාපන කළමනාකරණ ව්‍යුහය වෙනස් වූයේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු - 07)

(iii.) 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් පසු ගුරුවරයාගේ භූමිකාව වෙනස් වූ අයුරු උදාහරණ **පහක් (05)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු - 08)

10. (i.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන වගකීම් ලැයිස්තු ගත කරන්න. (ලකුණු - 05)

(ii.) ශ්‍රී ලංකාවේ කලාප අධ්‍යාපන කාර්යාලයක **සංවිධාන** ව්‍යුහය ඇඳ පෙන්වන්න. (ලකුණු - 07)

(iii.) ශ්‍රී ලංකාවේ කලාප අධ්‍යාපන කාර්යාලයේ භූමිකා උදාහරණ **පහක් (05)** දක්වමින් විස්තර කරන්න. (ලකුණු - 08)

11. (i.) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල්වල පන්තිකාමර කළමනාකරණය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු - 05)

(ii.) ප්‍රාථමික පාසල් ගුරුවරු විසින් ඵලදායි ඉගෙනුම් පරිසරයක් පන්තිකාමරය තුළ නිර්මාණය කරන්නේ කෙසේදැයි උදාහරණ පහක් (05) දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු - 07)

(iii.) ප්‍රාථමික පාසලක ගුරුවරුන් විසින් ඵලදායි ඉගෙනුම් පරිසරයක් පන්තිකාමරය තුළ නිර්මාණය කිරීමේදී මුහුණ දෙන ගුටළු මොනවාද? (ලකුණු - 08)

12. (i.) "ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන පද්ධතිය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා අධීක්ෂණය ඉතා වැදගත් වේ."
ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? උදාහරණ **පහක් (05)** දක්වමින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික පාසල් අධීක්ෂණයේදී අධීක්ෂකවරුන් මුහුණ දෙන ගැටලු විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු - 10)

13. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i.) ශ්‍රී ලංකාවේ පූර්ව ගුරු පුහුණු (Pre-Service) වැඩ සටහනක්.

(ii.) ශ්‍රී ලංකාවේ සේවාස්ථ ගුරුපුහුණු (In-service) වැඩ සටහන්.

(iii.) ප්‍රාථමික පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම්.

(iv.) ප්‍රාථමික පාසලක භෞතික සම්පත් කළමනාකරණය

(ලකුණු - 10 X 2 = 20)

හිමිකම් ඇවිරිණි.